450

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - III වන මට්ටම**

**ව්‍යවස්ථා සහ ලේඛන අර්ථ නිරූපණය LLU 3406**

**අවසාන පරීක්ෂණය**

**කාලය : පැය තුන (03) යි**

| | |
|---|---|
| **දිනය : 10-03-2024** | **වේලාව : පෙ.ව 9.30 -ප.ව 12.30** |

**මුළු ප්‍රශ්න ගණන - 08**

**ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.**

1. "අපගේම ව්‍යවස්ථාවක් අර්ථනිරූපනය කරන විටකදී වුවද, සම්ප්‍රදායික ප්‍රවේශය ඉවත දමා වඩාත් ලිබරල්වාදී ප්‍රවේශයක් අනුගමනය කළ යුත්තේය. අප එවැනි ප්‍රවේශයක් යොදාගත යුත්තේ, 'ව්‍යවස්ථාදායකයේ සාමාන්‍ය අරමුණු' අදාල ප්‍රතිපාදනයෙන් ප්‍රවර්ධනය වනතාක් පමණී."

   (ඩෙනින් සාමිවරයා *Seaford Court Estates Ltd. v. Asher,* (1949) 2 K.B. 481 (498)

   ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද?
   'ව්‍යවස්ථාදායකයේ සාමාන්‍ය අරමුණ' (General legislative purpose) සෙවීම සඳහා අධිකරණය විසින් යොදාගනු ලබන විවිධ අධිකරණමය ප්‍රවේශයන්ගේ සාර්ථකභාවය පරීක්ෂා කරන්න. ශ්‍රී ලංකාව සහ වෙනත් අධිකරණ බල ප්‍රදේශ දෙකක නඩු තීන්දු නීතිය උපුටා දක්වමින් ඔබගේ තර්කය සනාථ කරන්න.

   (ලකුණු 20)

2. රාහුල්, ඔහුගේ නීත්‍යානුකූල භාරකරු වන මාමා සමඟ "ලේක්ලන්ඩ්" ප්‍රාන්තයේ පදිංචිව සිටින 16 හැවිරිදි පිරිමි දරුවෙකි. රාහුල් ගමේ පිහිටා ඇති රජයේ පාසලක ඉගෙනුම ලබයි. පාසල් වේලාවෙන් පසුව, ඔහු තම මාමාට සහ ඔවුන්ගේ පවුලට අයත් සිල්ලර වෙළඳසැලේ කටයුතු සඳහා උපකාර කරනු ලබන අතර රාක්ක සංවිධානය කිරීම සහ ගනුදෙනුකරුවන්ට සහාය වීම වැනි කාර්යයන් සිදුකරයි. ඒ උදෙසා ඔහුට කුඩා දෛනික දීමනාවක් ලැබේ.

   2022 පෙබරවාරි මාසයේදී ලේක්ලන්ඩ් ප්‍රාන්තය විසින් 'තරුණ පුද්ගලයන් සේවයෙහි යෙදවීමේ ආරක්ෂණ පනත'('Youth Employment Protection Act') හඳුන්වා දෙන ලදී. එම පනතේ පූර්විකාවේ මෙසේ සඳහන් වේ: " තරුණ පුද්ගලයන් සේවයේ යෙදවීමේදී ඔවුන්ගේ යහපත

ආරක්ෂා කිරීම සඳහා වූ පනතකි. මෙම පනතේ අරමුණ වන්නේ තරුණ ප්‍රජාව ඔවුන්ගේ යහපැවැත්මට, අධ්‍යාපනයට හෝ සමස්ත සංවර්ධනයට අහිතකර රැකියාවක නොයෙදෙන බව සහතික කිරීමයි."

තවද, එම පනතේ පහත සඳහන් ප්‍රතිපාදන අඩංගු වේ:

> **4 වන වගන්තිය:** 'කිසිම පුද්ගලයෙකු විසින් තරුණ පුද්ගලයෙකුව, ඔවුන්ගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට, අධ්‍යාපනයට හෝ සාමාන්‍ය සුභසාධනයට අහිතකර කිසිම කාර්යයක යොදවා නොගත යුතුය'
>
> පැහැදිලි කිරීම: "මෙම පනත හරහා තරුණ ප්‍රජාව ඔවුන්ගේ අධ්‍යාපනයට සහ යහපැවැත්මට බාධාවක් නොවන, ඔවුන්ගේ කුසලතා සහ පුද්ගල සංවර්ධනයට ධනාත්මක ලෙස දායක වන සැහැල්ලු, අන්තරායකර නොවන රැකියාවල නියැලීම තහනම් කර නොමැත."

පනතේ **II උපලේඛනයෙන්** ඔවුන්ගේ ආරක්ෂාවට හෝ අධ්‍යාපනයට තර්ජනයක් නොවන පරිදි කුසලතා සහ වගකීම් වැඩි දියුණු කරන ක්‍රියාකාරකම් ඇතුළුව, තරුණ පුද්ගලයින්ට සුදුසු 'අවසර ලත් වැඩ' ලැයිස්තුවක් සපයයි.

තවද, 20 වන වගන්තිය 'තරුණයෙකු' යනු, 'වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකු' ලෙස අර්ථ දක්වන අතර 'අනර්ථකාරී රැකියා' යනු, " ස්වභාවය හෝ තත්වයන් අනුව, තරුණයන්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව, අධ්‍යාපනය හෝ සාමාන්‍ය සුභසාධනයට හානි කිරීමට ඉඩ ඇති රැකියාවන්" ලෙස අර්ථ දක්වයි.

රාහුල්ගේ පන්තිභාර ගුරුවරයා විසින් දිනක ඔහුගේ අත්වල තැලීම් සලකුනු දකින අතර ඔහු පන්තියේ අවධානය යොමු කිරීමට වෙහෙසෙන බව ද නිරීක්ෂණය කරයි. රාහුල් පවුලට අයත් වෙළඳසැලේ සේවය කරන බව ගුරුවරයා දැන ගන්නා අතර රාහුල් ඔහුගේ යහපැවැත්මට අහිතකර වැඩක නිරත වන බවට චෝදනා කරමින් පොලිසියට පැමිණිල්ලක් කිරීමට තීරණය කරයි. උසාවියේදී, රාහුල්ගේ මාමා තර්ක කරනුයේ රාහුල් කරන කාර්යය අනතුරුදායක නොවන බවත් ඔහුගේ පෞද්ගලික වර්ධනයට ධනාත්මක ලෙස දායක වන බවත්ය. මෙම කාර්යය රාහුල්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව සහ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑ හැකි බව ප්‍රාන්තය තර්ක කරයි.

මෙම නඩුවේ විනිසුරුවරයා ලෙස ඔබ ගන්නා තීරණය කුමක්ද? '2022 තරුණ පුද්ගලයන් සේවයෙහි යෙදවීමේ ආරක්ෂණ පනත'ට අදාළ විධිවිධාන අර්ථ නිරූපණය කිරීමේදී ඔබ භාවිතා කරන අර්ථ නිරූපණ රීතීන් සහ අභ්‍යන්තර, බාහිර ආධාරක ඇසුරෙන් හේතු දක්වමින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. ලේක්ලන්ඩ් හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන යැයි සිතන්න.

(ලකුණු 20)

3. "පොදු නීතියේ මූලධර්ම ලෙස පූර්ව නිගමන (Presumptions) තුල සාධාරණ වටිනාකම් සහ යුක්තියේ සහජ මූලධර්ම ඇතුළත් වේ.පූර්ව නිගමන පසුපස පවතින මූලධර්මය වන දරුණු, අයුක්තිසහගත හෝ අසාධාරණ ප්‍රතිඵල අපේක්ෂා නොකරයි යන්න අයිතිවාසිකම් පනතේ අන්තර්ගත මූලික අයිතිවාසිකම් වල ජීවගුණය හා පරාසය සමග අනුකූලව යයි."

(Annette Singh *'The impact of the constitution on transforming the process of statutory interpretation in South Africa'* (2014)

ඉහත ප්‍රකාශයේ ආලෝකයෙන් අධිකරණයේ යුක්තිය පසදලීමේ දී සහ තනිපුද්ගල අයිතිවාසිකම් ආරක්ශා කිරීමේදී පොදු නීතිය තුල පූර්ව නිගමන වල කාර්යභාරය ඇගයීමට ලක්කරන්න. ඔබේ පිළිතුර අවම වශයෙන් පූර්ව නිගමන තුනක්වත් (03)අවධාරණය කළයුතු අතර නඩු තීන්දු නීතිය හරහා සනාථ කළ යුතුය.

(ලකුණු 20)

4. ඇස්ටෝරියා විශ්ව විද්‍යාලයේ විද්‍යා ශිෂ්‍යාවක් වන කේට්ව විශ්ව විද්‍යාලයේ රසායනාගාරයට ඇතුළු වන ස්ථානයේ දී අහඹු ආරක්ෂක පරීක්ෂාවකට ලක් කරයි. ඇයගේ බෑගයේ තිබී රසායනික ද්‍රව්‍ය අඩංගු කුඩා කුප්පියක් ආරක්ෂක නිලධාරීන්ට හමුවෙයි. පූර්ව අනුමැතියකින් තොරව කිසියම් රසායනික ද්‍රව්‍යයක් අනවසරයෙන් සන්තකයේ තබා ගැනීම තහනම් බවට, දැඩි ප්‍රතිපත්තියක් විශ්ව විද්‍යාලයේ 'රසායනික ආරක්ෂණ සහ රසායනාගාර ආරක්ෂණ පනතේ' (Chemical Safety and Laboratory Security Act ) පවතින අතර කේට් අවධාරනය කරන්නේ එම රසායනික ද්‍රව්‍යය හානිකර නොවන බවත් ඇගේ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා පුද්ගලික අත්හදා බැලීමක කොටසක් බවත්ය. මෙම නඩුවේ විනිශ්චයකරු ඔබ යැයි උපකල්පනය කළහොත්, කේට්ගේ තත්වය සම්බන්ධයෙන් රසායනික ආරක්ෂාව සහ රසායනාගාර ආරක්ෂණ පනත ඔබ අර්ථනිරූපනය කරන්නේ කෙසේද?
නඩු තීන්දු නීතිය ඇසුරෙන් අර්ථනිරූපනයේදී යොදාගන්නා නීතිමය ආප්තයන්ගේ අදාලත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

5. මෙටා විශ්ව විද්‍යාලයේ පාරිසරික නීතිය පිළිබඳ උපාධි අපේක්ෂකයෙකු වන ප්‍රවීන්, ස්වභාවික සම්පත් නීතිය පිළිබඳ ඔහුගේ අවසාන විභාගයට මුහුණ දෙමින් සිටියේය. විභාග පටිපාටියට අනුව, විභාගය ආරම්භ වීමට මිනිත්තු පහකට පෙර පිළිතුරු පොත්(answer booklets) බෙදා හරිනු ලැබේ. ප්‍රවීන්ට පිළිතුරු පොත ලැබුණු විට ඔහු විෂයට අදාළ ප්‍රතිපාදන සහ නඩු කිහිපයක් එහි සටහන් කළේය. නිරීක්ශකයෙකු පිළිතුරු පොතේ කවරයේ ලියා ඇති මෙම සටහන දුටු අතර එය ප්‍රධාන පරීක්ෂකට වාර්තා කරන ලද්දේ ප්‍රවීන් විසින් විභාග වරදක් කරන ලද බව දන්වමිනි. විශ්වවිද්‍යාල විභාග රෙගුලාසි පහත පරිදි සඳහන් වේ.

**6.1.1.** විභාගය අතරතුර අනවසර ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටින ඕනෑම අපේක්ෂකයෙකු විභාග වරදක් කර ඇතැයි සැලකේ. අනවසර ද්‍රව්‍ය කෙටි සටහන්, පාඨමාලා ද්‍රව්‍ය,

ඉලෙක්ට්‍රොනික උපාංග සහ සමාන කාර්යයක් සහිත අයිතම වලින් සමන්විත නමුත් ඒවාට සීමා නොවේ.

ප්‍රධාන පරීක්ෂකවරයා මෙම සිද්ධිය විශ්වවිද්‍යාලයට වාර්තා කළේය. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට නියමිතය. රෙගුලාසිවල සඳහන් වන්නේ 'අනවසර ද්‍රව්‍ය' පමණක් වන නිසාත්, ඔහුගේ සටහන් ඔහුට ලබා දී ඇති පිළිතුරු පොතේ කවර පිටුවට පමණක් සීමා වූ නිසාත් තමා කිසිදු නීති කඩ නොකළ බව ප්‍රවීන් විශ්වාස කරයි.

ව්‍යවස්ථාපිත අර්ථ නිරූපනයේ අදාළ රීති යෙදීමෙන්, මෙටා විශ්වවිද්‍යාලයේ විභාග රෙගුලාසිවලට අනුව ප්‍රවීන් විභාග වරදක් කර ඇත්දැයි පරීක්ෂා කරන්න.

අදාළ නීති බලධාරීන් සමඟ ඔබේ විශ්ලේෂණය සනාථ කරන්න.

(ලකුණු 20)

6. වයිල්ඩ් අයිලන්ඩ් යනු, කාලානුරූපී මැතිවරණ බාධාවකින් තොරව පැවැත්වීමේ භාවිතාවක් පවතින ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් ඇති රාජ්‍යයකි. 2022 දී රට ආර්ථික අර්බුදයකට මුහුණ දුන් අතර. වයිල්ඩ් අයිලන්ඩ් හි අභිනවයෙන් තේරී පත් වූ ජනාධිපති ජේ මහතා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරමින් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා තමාට සහාය දෙන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටියේය. වයිල්ඩ් අයිලන්ඩ් හි පළාත් පාලන මැතිවරණය 2022 සැප්තැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ජනාධිපති ජේ ගේ නියෝග යටතේ රජය මැතිවරණ සඳහා නාමයෝජනා නොකැඳවීමට තීරණය කළේය. අර්බුදකාරී මොහොතක ජාතිය එකට සිටිය යුතු බවත්, මැතිවරණ සමාජ සංහිඳියාවට බාධා කරන බවත් රජය කියා සිටියේය. පළාත් පාලන මැතිවරණයේ දී විපක්ෂයේ ඉදිරියට ඒම වැළැක්වීම සඳහා මෙය සිදු කළ බව විරුද්ධ පක්ෂ චෝදනා කරයි. විපක්ෂයේ ක්‍රියාකාරීන් තර්ක කරන්නේ පළාත් පාලන මැතිවරණය නොපැවැත්වීම තුළින් රජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවයි.
වයිල්ඩ් අයිලන්ඩ් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ඡන්ද බලයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන පහත පරිදි වේ.

> **3** වන වගන්තිය. වයිල්ඩ් අයිලන්ඩ් ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව සතු වන අතර එය අත්හළ නොහැකි ය. පරමාධිපත්‍යයට ආණ්ඩු බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ඇතුළත් වේ.
>
> **4** වන වගන්තිය. ජනතා පරමාධිපත්‍යය පහත දැක්වෙන ආකාරයෙන් ක්‍රියාත්මක කර භුක්ති විඳිය යුතුය:–
>
> [...] (ඉ) වයස අවුරුදු දහඅට සම්පූර්ණ වූ සෑම පුරවැසියෙකුටම ජනරජයේ ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේදී සහ සෑම ජනමත විචාරණයකදීම ඡන්ද බලය භාවිතා කළ හැකිය [...]

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය පහත සඳහන් කොන්දේසි යටතේ ප්‍රකාශනයේ නිදහස පිළිගනී.

**14(1)** වන වගන්තිය. සෑම පුරවැසියෙකුටම-

(අ) භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස පවතී; [...]

විපක්ෂයේ ක්‍රියාකාරීන් තර්ක කරන්නේ රජයේ තීරණය පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීමක් බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අර්ථ නිරූපණය සඳහා විවිධ ප්‍රවේශයන් කෙරෙහි අවධානය යොමු කරන අතර, අයිතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විපක්ෂයට නීත්‍යානුකූලව සාර්ථක ප්‍රකාශයක් කළ හැකිද යන්න සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ නීති අධිකාරීන්ගෙන් සනාථ කරන්න.

(ලකුණු 20)

7. 'අන්තර්ජාතික සම්මුතීන් ජාත්‍යන්තර නීති සම්පාදනයේ වැදගත් මූලාශ්‍රයකි. කෙසේ වෙතත්, මෙම සම්මුතීන් අර්ථනිරූපනය කරන ආකාරය දේශීය ව්‍යවස්ථාවන් අර්ථ නිරූපණය කරන ආකාරයට වඩා වෙනස් වේ.'

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? සුදුසු උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

8. පහත සඳහන් දේ ගැන කෙටි සටහන් ලියන්න,

(අ) ව්‍යවස්ථාපිත භාෂාව සහ ලිංගික පක්ෂග්‍රාහීත්වය. (Gender bias)

(ආ) නීතිමය භාෂාවේ අවිනිශ්චිතභාවය

(ඇ) බලතල වෙන් කිරීම සහ අධිකරණමය අර්ථ නිරූපණය

(ඈ) *Ut res magis valeat quam pereat* ආප්තය.

(ලකුණු 5×4 =20)

***සියළුම හිමිකම් ඇවිරිණි***